# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 92 — 1973 දෙසැම්බර් 28 වැනි සිකුරාද — 1973.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස:—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | අතිරේක | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දන්වීම් ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දන්වීම් ... ... ... | 230 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දන්වීම් ... ... | 229 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම් ... ... ... | — | විවිධ දන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත; විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පල කරන ලදී.

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දන්වීම්

### අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවිය

වටිනාකමක් නැති ලේඛන විනාශකර දැමීම

වටිනාකමක් නැති ලේඛන විනාශකිරීමේ ආඥා පනතේ (පරිච්ඡෙද 479 වෙලුම XII) විධිවිධානයන්ට අනුව විස්තර වශයෙන් පහතින් සඳහන් කර ඇති නඩු මෙදින සිට තෙමසක් ගතවීමෙන් පසු විනාශ කරන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ලේඛණයන් විනාශ නො කිරීමට සෑහෙන හේතු දක්වීමට බලාපොරොත්තුවන්නන් ඇතොත් එම විරුද්ධත්වය ඉහත කී කාල සීමාව ඇතුලත දී පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකුගේ මාර්ගයෙන් හෝ නිත්‍යානුකූල පෙත්සමක් මගින් හෝ ඉදිරිපත් කල යුතුයි.

විනාශ කිරීමට සටහන් කර ඇති ලේඛණ වල විස්තර

| වර්ෂය | | නඩු අංකය | | වර්ගය |
|---|---|---|---|---|
| 1945–1951 | ... | ඉ.ඌ. 19000–20644 | ... | මුදල් |
| 1951–1960 | ... | ඉ.ඌ. 1–1200 | ... ... | මුදල් |
| 1940–1958 | ... | දි.ඌ. 3175–9000 | ... ... | මුදල් |

ජී. සී. ඩබ්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1973 දෙසැම්බර් මස 13 දින,
අවිස්සාවේල්ල, දිස්ත්‍රික් උසාවියේ දී ය.

12–876—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.**

**1972 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. ඊ. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

229—බී 71144——5,732 (73/12)

# බුදල් නඩු පිළිබඳ දැන්වීම්

### ගම්පහ දිස්ත්‍රික් උසාවියේ දීය

### නයිසයි ආඥාව

බොල්ලතේ "සොම්සිරි" හි පදිංචිව සිට නැසීගිය කුරුවිට ආරච්චිගේ දෙන් මාර්පල්ගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලේ කාරණාව ගැනයි.

බොල්ලතේ "සොම්සිරි" හි පදිංචි ලැටිෂියා බ්‍රිජට් කුරුවිට, විවාහයට පෙර සේතුංග මුදලිගේ දෝන ලැටිෂියා බ්‍රිජට් ........................................ පෙත්සම්කාරිය.

අංක 1171/බූදල්

එදිරිව

1. බොල්ලතේ "සොම්සිරි" හි පදිංචිකරුවන් වන කුරුවිට ආරච්චිගේ දෝන එලිසබෙත් කාන්ති, 2. එම්ගේ දෙන් සිසිල් ජුඩ් පැරකුම් 3. එම්ගේ දෝන ශ්‍යාමලී ප්‍රීති (සියලු දෙනාම බාලවයස්කරුවන්) 4. යක්කල පදිංචි ජයන්තා ජයකොඩි (ඉහත නම් සඳහන් බාලවයස්කරුවන්ගේ යෝජිත භාරකරු) ........................................ වගඋත්තරකරුවෝ.

මෙම කාරණය වර්ෂ 1973ක් වූ දෙසැම්බර් මස 19 වෙනි දින ගම්පහ දිසා විනිසුරු තැන්පත් ඇස්. ඩී. ජයසුන්දර මහතා ඉදිරියේ පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ තිස්ස කරුණාරත්න මහතා පෙනී සිටියදී පෙත්සම්කාරියගේ වර්ෂ 1973ක්වූ දෙසැම්බර් මස 18 වෙනි දින දිවුරුම් පෙත්සම කියවා බලා,

මේ ගැන සැලකිලිමත් වන අයෙක් හෝ අයවලුන් වර්ෂ 1974ක්වූ පෙබරවාරි මස 26 වෙනි දින හෝ ඊට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සැහෙන විරුද්ධතාවයක් දක්වා නොසිටියහොත් ඉහත නම් සඳහන් නැසීගිය අයගේ වැන්දඹුව වශයෙන් මෙම බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කරවා ගැනීමට පෙත්සම්කාරියට අයිතිය ලැබිය යුතු බව සහ මෙයින් ලැබෙන බවත් මෙයින් නියෝග කරනු ලැබේ.

තවද, වර්ෂ 1974 ක්වූ පෙබරවාරි මස 26 වෙනි දිනට හෝ ඊට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සැහෙන විරුද්ධතාවයක් දක්වා නොසිටියහොත් ඉහත නම් සඳහන් 1, 2 සහ 3 දරණ බාල වයස්කරුවන්ගේ භාරකරු වශයෙන් ඉහත නම් සඳහන් 4 වෙනි වගඋත්තරකරු පත්කරන බවද මෙයින් නියෝග කරනු ලැබේ.

ඇස්. ඩී. ජයසුන්දර,
දිසා විනිසුරු.

වර්ෂ 1973ක්වූ දෙසැම්බර් මස 19 වෙනි දින දීය.

12–1127—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

### කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ දීය

### නයිසයි නියෝගයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ උඩපොල මැදලස්සේ කෝරළේ අරඹෙපොල පදිංචිව සිට මියගිය රිචඩ් බර්නාඩ් මඩවල රටේ මහත්මයාගේ අන්තිම කැමති පත්‍රයකින් නොපැවරූ බූදලය සම්බන්ධයෙනි.

මියගිය තැනැත්තා.

බස්නාහිර පළාතේ කොළඹ වැතැම් වීදියේ ද මැල් ගොඩ නැගිල්ලේ දෙවෙනි මහලේ පදිංචි ජයන්ත මඩවල ........................................ පෙත්සම්කරු.

බූදල් නඩුවේ අංක 6383/ට

එරෙහිව

1. ඉහත සඳහන් අරඹෙපොල පදිංචිකාරයන් වන සෝමා මඩවල කුමාරිහාමි

2. උපාලි මඩවල ........................................ වගඋත්තරකාරයෝ.

මෙම කාරණය වර්ෂ 1973 ක්වූ ජූලි මස 24 වෙනි දින කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර ඇම්. ඇම්. අබ්දුල් කාදර් මහතා ඉදිරිපිට තීරණය කිරීම පිණිස ගෙන පෙත්සම්කාර පක්ෂය වෙනුවෙන් පි. දසනායක නීතිඥ මහතා පෙනී සිටියදී ඉහතකී පෙත්සම්කරුගේ 1973නේ ජූලි මස 14 වෙනි දින දරණ දිවරුම් පත කියවා බලා.,

වර්ෂ 1973 ක්වූ ඔක්තෝබර් මස 30 වෙනිදට හෝ ඊට පෙර වගඋත්තරකාරයන් විසින් හෝ බූදලය ගැන සැලකිලිමත් වන වෙනත් අයකු හෝ අය විසින් හෝ තම විරුද්ධයට හේතු කාරණා මෙම උසාවියට ඒත්තු යනාකාර කියා නොසිටියහොත් ඉහත නම් කළ පෙත්සම්කරු මියගිය තැනැත්තාගේ පුතකු වන හෙයින් ඔහුගේ බූදලය පාලනය කිරීමේ අද්මිනිස්ත්‍රාසි බලකඩදාසි පෙත්සම්කරුට අනුපිළිවෙලින් හිමි කර දෙනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඇම්. ඇම්. අබ්දුල් කාදර්,
දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1973 ක්වූ ජූලි මස 24 වෙනි දින දීය,

විරුද්ධකාරණා කියා සිටීම සඳහා මෙය 1974.2.5 දින තෙක් කල් තබන ලදී.

ඇම්. ඇම්. අබ්දුල් කාදර්,
දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1973 ක්වූ ඔක්තෝබර් මස 30 වන දින දීය.

12–1128—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1974

| මාසය | පලකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා දැන්ම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 04.01.74 | සිකුරාද ... | 28.12.73 | සිකුරාද | දවල් | 12.00 |
| | 11.01.74 | සිකුරාද ... | 04.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.01.74 | සිකුරාද ... | 11.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 25.01.74 | සිකුරාද ... | 18.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි ... | 01.02.74 | සිකුරාද ... | 25.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 08.02.74 | සිකුරාද ... | 01.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 15.02.74 | සිකුරාද ... | 08.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 22.02.74 | සිකුරාද ... | 15.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු ... | 01.03.74 | සිකුරාද ... | 22.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 08.03.74 | සිකුරාද ... | 01.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 15.03.74 | සිකුරාද ... | 08.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 22.03.74 | සිකුරාද ... | 15.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 29.03.74 | සිකුරාද ... | 22.03.74 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1974 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.